# වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ /54 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි

### 2022-08-05

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
13. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
15. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
16. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
17. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
18. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
19. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
20. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
21. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
22. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
24. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
25. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
26. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
27. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය

28. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මිය
29. ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය
30. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
31. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
32. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
33. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. <u>2022-07-14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.</u>

තීරණ අංක 01

2022-07-14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

- ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභාවෙන් පැන නැඟෙන ගැටළු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව ඉල්ලා සිටින ලදී. පසුගිය රැස්වීම් වාර්තාවේ පිටු අංක 04හි අවසන් ඡේදයේ තීරණ අංක 08හි සංශෝධනය සඳහන් වී තිබෙන බවත්,එම තීරණය යටතේ දකුණු කම්මල පිහිටි ඉඩම මිනුම් කර කම්බි ගසා නිවැරදි තක්සේරුවක් ගනිමුයැයි සඳහන් වී ඇති බවත් ඒ පිළිබඳව ප්‍රගතිය විමසා සිටින ලදී.

කම්බි ගැසීම සඳහා රුපියල් දෙලක්ෂ අනුදහසක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත්,එය කර්මාන්ත කමිටුව වෙත යොමු කරන බවත් එමෙන්ම සෙන්දිරියාමුල්ල ඉඩමේ කම්බි ගැසීම සඳහා රුපියල් දහනව ලක්ෂ හතලිස් හතර දහස් තුන්සිය පනස් නවයක ඇස්තමේන්තුවක්ද තිබෙන බවත් මන්ද එය අක්කර 04ක භූමි ප්‍රමාණයක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මේ දින වල ඉඩම් කීපයකම මිනුම් කටයුතු කල බවත්,මෙම ඉඩමත් ඉක්මනින්ම මිනුම් කටයුතු සිදු කර අවසන් කරන බවත් ඉන්පසුව කම්බි ගසා එහි ආරක්ෂාව තහවුරු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

සෙන්දිරියාමුල්ල ඉඩම මැනුම් කටයුතු කර තිබේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එම ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් මිලදී ගැනීම සඳහා ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවන ගාස්තුව හා අනෙකුත් කටයුතු සඳහා අයවැයක් සාදා ගත්තේ නම් හොඳයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම මැනුම් කටයුතු සිදු කරන සුමිත් මහතාගේ ගාස්තුවද සහා ගත කලේ නම් හොඳ බවත් ප්‍රකාශ කරන ලදී.සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගණයේ කම්බි ගසන වියදම එමෙන්ම මැනුම් කටයුතු සිදු කරන්නේ නම් එම ගාස්තුව යන සියල්ල සඳහා අයවැයක් සකස් කලේ නම් හොඳ බව ද ප්‍රකාශ කරන ලදී.

එම ඉඩම නැවත මැනුම් කර භාර ගන්නේද නැතිනම් මැනුම් කර භාර දී තිබේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එය මැනුම් කර භාර දී තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීම් කටයුතු කලේදැයිදගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

ගෙවීම් නොකල බවත්, එම ඉඩම බදු පදනම යටතේ නොව සින්නක්කර ලබා දෙන ලෙසට ඉල්ලීමක් කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම ඉඩම මිල දී ගැනීමට සූදානමින් සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

එහි වැය මුදල ද සකස් කර මෙම වැඩ කටයුතු අවසන් කලේ නම් හොඳ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ලබන මාසය වන විට තක්සේරුවක් ලැබෙයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා රජයේ ප්‍රධානත්වයක් ගැනීමට නොහැකි දැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

ඒ සඳහා කතා කිරීම පලක් නොවන බවත්, රස්තියාදු වීමට සිදු වන බවත්, මෙම ඉඩම සංවර්ධනය නොවූ ඉඩමක් ලෙස තක්සේරු කරන ලෙස තමන්ට පැවසූ බවත් එලෙස තමන් ඉල්ලීම් කර ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නැතිනම් ඉඩමේ තිබෙන ලිඳ අපට නොලැබෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ලිඳ දංකොටුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉඩමද අනිවාර්යයෙන්ම නැවත මැනිය යුතු බවත්, අනෙක් පසින් මාර්ගයක්ද ලබා දී ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම භූමිය සඳහා පිඹුරක් සුමිත් මහතාට කියා ඇඳගෙන තිබෙන බවත්, ඒ අනුව අපට අයත් අක්කර 04ට පිඹුරුපතක් තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහිදී එම පාර හා ලිඳ අතහැර එය සකස් කර තිබේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

එම පිඹුරුපත සභා ගත කරන ලෙසට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ඉල්ලා සිටින ලදී.

එය සභාගත කරන බවත්, ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා පැවසූ පරිදි කම්බි ගැසීමට යන මුදලද, මැනුම් කටයුතු සිදු කිරිමට යන මුදලද සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.කොම්පෝස්ට් අංගණය සඳහා මුදල ලැබෙන තෙක් වැඩ ටික කරමුයැයි මහා සභා තීරණයක්ද ගෙන තිබෙන බවත්, කෝටියක් පමණ වැය කර ඇති බවත් තවත් කෝටියක පමණ මුදලක් වැය වූ පසුව වැඩ කටයුතු අවසන් වන බවත් ප්‍රකාශ කරන ලදී.

මායිම් ගල් දමා නොමැති නම් නැවත මැනුම් කිරීමට සිදු වන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

හරියටම මායිම් හරි නම් ගැටළුවක් නොවන බවත්,නැතිනම් නැවත එය මැනුම් කරමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මුදල් ලබා දීමට පෙර නැවත මැනුම් කටයුතු කරමුයැයිද,රු.30000ක් පමණ වැය වුවත් වටිනාකම තිබෙන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී,

- පසුගිය රැස්වීම් වාර්තාවේ 11 වන පිටුවේ තීරණ අංක 04හි කම්මල,වයික්කාල ඩොල්ෆින් හෝටලය සම්බන්ධ නඩු කටයුත්ත සඳහා තීරණයක් ගෙන තිබෙන බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එම නඩු ගාස්තුව රුපියල් ලක්ෂ 09ක් දක්වා අඩු කර ගැනීමට හැකි වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එහි එක් නඩු වාරයක් පැවැත්වූ බවත් පළමු වාරිකය ලෙස නීතඥවරයාට රුපියල් ලක්ෂ 03ක් ගෙවීම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

- පසුගිය රැස්වීම් වාර්තාවේ 13 වන පිටුවේ සූර්ය බල ශක්ති පද්ධතිය පිළිබඳව සාකච්ඡා කර තිබෙන බවත්,එහිදී රාත්‍රී කාලයේ බල්බ දැල්වීම හා උදෑසන නිවීම පිළිබඳව ගරු සභාපතිතුමා විසින් සිදු කර තිබෙන ඉල්ලීම හොඳ බවත් එය සිදු විය යුතු වැඩ කටයුත්තක් බවත්, ඒ පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

2022 ජූලි මස 29 වන දින පුවත් පත් මඟින් මේ සඳහා ටෙන්ඩර් කැඳවා ඇති බවත්, ලබන සතිය වන විට ඉංජිනේරුමහතා හමුවී මෙම කටයුතු සූදානම් කරන බවත්, 2022 අගෝස්තු මස 22 වන දිනෙන් පසුව ටෙන්ඩර්කරු තෝරාගෙන වැඩකටයුතු ආරම්භ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ටෙන්ඩර් කැඳවා තිබෙන පත්තරය කුමක්දැයි ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී.

දිණමින,daily news,දිනකරන් යන පුවත්පත් වල පුවත්පත් දැන්වීමක් මඟින් ටෙන්ඩර් කැඳවා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- පසුගිය රැස්වීම් වාර්තාවේ 15 වන පිටුවේ තීරණ අංක 06 යටතේ දංකොටුව උප කාර්යාලයට අයත් වන බිම් කොටස පිළිබඳ තිබෙන බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මේ සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කර රජයේ මිනින්දෝරුවෙකු ගෙන්වා සම්පූර්ණයෙන් මැනුම් කර කටයුතු කිරීමට භාර දී ඇති බවත් ලබන සතිය වන විට එම කටයුතු අවසන් වන බවත් ඊට පසුව මහා

සභාව සඳහා එම ප්‍රගතිය ලබා දෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. පැරණි පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට අවසරය ලබා දුන් බවත් ඒ සඳහා රජයේ මිනින්දෝරු මහතෙකු ලවාම මැනුම් කල යුතු බවත් එම කටයුතු පුත්තලමෙන් සිදු කර දෙන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

පුත්තලමෙන් මැනුම් කටයුතු සිදු කලද රජයේ නිලධාරීන් ඒ ඒ වාසි තකා මැනුම් කටයුතු කිරීමට හැකි බවත්, කෙසේ නමුත් එම අවස්ථාවට ගරු සභාපතිතුමාද යන බවත් ගරු සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කල පරිදි භූමියේ සැලැස්ම සඳහන් විය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සභාව මගින් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා අවසරය ලබා දෙනුයේ ප්ලෑන් එකට අතට ගත්තායින් පසුව බවත් එතෙක් ඒ සඳහා අවසරය ලබා නොදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය ගැටළුවක් නොවන බවත්, ප්‍රාදේශීය ලේකම් නිල නිවසට යාමට සහ අප සභාවේ පෙර පාසලට යාමට පොදු පාරක් තිබෙන බවත් ගරු සභාපතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

- පසුගිය රැස්වීම් වාර්තාවේ 18 වන පිටුවේ 2022.06.30 වන දින පැවති පරිසර හා මහජන පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම යටතේ රංග ටේලර්ස් සම්බන්ධව සාකච්ඡා කර ඇති බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදි.

  ඒ සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලැබී තිබෙන බවත්, එම වාර්තාව අනුව කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එය සභාගත කරන ලෙසට ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

- 2022-07-28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා තමන්ට සහභාගී වීමට නොහැකි වූ බවත් ,එහිදී තේක්ක ගස් දෙකක් කපා ඉවත් කිරීමක් පිළිබඳව ටෙන්ඩර් කැඳවීමක් කර තීරණයක් ගෙන ඇති බවත්, ඒ සඳහා තාක්ෂණ නිලධාරී මගින් වාර්තාවක් ගෙන තිබේදැයි ද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

තාක්ෂණ නිළධාරී වාර්තාවක් ගෙන ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තේක්ක ගසක් රු.20,000ක් 30,000ක් පමණ වටිනා බවත්, මෙය වට අඩි කීයක ගසක්ද යන්නත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

තමන්ද එදින මේ ප්‍රශ්නයම විමසූ බවත්, ගසේ ඉහළින් දිරාපත් වීමක් තිබෙන බව එහිදී දැන ගැනීමට ලැබුණ බවත්, ගස් මැරි නොමැති බවත් නමුත් මාර්ගයේ විදුලි රැහැන් වලට අතු වැදීමක් සිදු වී ඇති බවත් එම නිසා වරින්වර අතු කැපීම නිසා ගසේ කඳ පමණක් ඉතිරි වී ඇතැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගස් දෙකම රු.20,000ට ලබා දී ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

අවශ්‍ය නම් එහි සම්පූර්ණ වාර්තාවම ලබා දීමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- පසුගිය මහා සභා වාර්තාවේ තීරණ අංක 08 බලන ලෙසත්, එහිදී සාකච්ඡා කර තිබෙනුයේ 2022 දෙසැම්බර් 31 වන තෙක් සේවා දිගුවක් ලබාදෙන ලෙසටත්,නමුත් අවසන් තීරණය 2023 පෙබරවාරි මස 15 දක්වා ලෙස සඳහන් කර ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. මහා සභාවේ සාක්ෂා කොට එකඟතාවය ලබාගෙන තිබෙනුයේ එසේ නොවන බවත්, ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනාවට ගරු සභාපතිතුමා එකඟ වී තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

  ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනාව අනුව 2022 දෙසැම්බර් 31 වන තෙක් සේවා දිගුව ලබා දීමට සිටි නමුත් සාමාන්‍යයෙන් සේවා දිගුවක් ලබා දීමේදී මාස 06කට එය ලබා දෙන බවත් එබැවින් මාස 06ක් සඳහා ඉල්ලූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  එසේ නම් තීරණය යටින් එය සඳහන් කරන ලෙසත්, නැතිනම් කතා කරපු දේ තීරණයේ සඳහන් කිරීමේදී වෙනස් වන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභා වාර්තාවේ 07 වන පිටුවේ google map එක සම්බන්ධයෙන් සඳහන් වී ඇති බවත්, එය වටිනා කටයුත්තක් බවත් ඒ පිළිබඳ සියළුම පාසල් දැනුවත් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් මෙම පාසල් පද්ධතිය සඳහා කොතෙක් සහයෝගය ලබා දුන්නද අපේ පාසල් වල විදුහල්පතිවරුන් විසින් අප සභාවේ google map එක බොරුයැයි මතයක් ගෙන යන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ඔවුන් අප සභාවේ google map එක නොව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ google map එක ගෙන එන ලෙසට පවසා ඇති බවත් ජනතාව වියදම් කර ගෙන එම ආයතනයට යන බවත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව ශුද්ධවූ පවුලේ බාලිකා විද්‍යාලයෙන් එසේ පවසා තිබූ බවත්,නමුත් තමන් දන්නා සියළුම දෙනාට අප රාජ්‍ය ආයතනයක් බැවින් මෙමඟින් එම සේවාව ලබා ගන්නා ලෙස පැවසූ බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට දන්වමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ අත්සනින් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට පාසල් 42 විදුහල්පතිවරුන්ට පසුගිය වසරේ ලිඛිතව යවන්නට කටයුතු කල බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.ගිය වසරේ 1200 පමණ සංඛ්‍යාවක් නිකුත් කරලා තිබෙන බවත්, පළමු වසරට සහ හය වසරට ඇතුල් වීමට මෙය බලපාන බවත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව ශා.ජෝෂප් වාස් විද්‍යාලයේ පළමු වසරට ඇතුල් වීමට අයදුම්පත් 600ක් පමණ ඉල්ලා ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පසුගිය කාලයේ වෙන්නප්පුව ශා. ජෝශප් වාස් විද්‍යාලයට ඇතුල් වීමට google map එකක් නොඉල්ලූ බවත් නමුත් දැන් ජාතික පාසලක් බැවින් එය ඉල්ලන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ග්‍රාමීය මට්ටමේ පාසල් සියල්ලම අප සහතිකය පිළිගත් බවත් කිසිඳු ගැටළුවක් නොතිබුණ බවත් ප්‍රකාශ කරන ලදී.මෙය ස්ථාන තුනක් පමණක් ප්‍රතික්ෂේප කල බවත් , ආගමික ප්‍රභූවරුන් එය සිදු කල බවත් ඔවුන් එම දෙමාපියන්ව රස්තියාදු කර google map එක ගෙන ඒමට දුන්කන්නාවට යැවූ බවත් ප්‍රකාශ කරන ලදී. අපේ කිරිමැටියාන නිලධාරීන් රාත්‍රී 7 ,8 වන තෙක් රැදී සිට එය ලබා දුන් බවත් ,එමෙන්ම අපගේ google map එක colour printout මඟින් හා black and white printout මඟින් ලබා දුන් බවත්, අප ආයනය නව අංග උපාංග යටතේ එය ලබා දුන් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. නාත්තන්ඩියෙන් ලබා දෙන google map එක තුළ යම් යම් පාසල් ඇතුළත් නොවූ බවත් උදාහරණයක් ලෙස google map එක තුල මිරිසන්කොටුව පාසල ඇතුළත් වන බවත්, නමුත් එම google map එක තුළ එය සඳහන් නොවන බවත් මෙය දෙමාපියන්ටද වාසියක් වූ බවත් ප්‍රකාශ කරන ලදී. මෙය සත්‍ය බවත් දෙමාපියන්ද දරුවන්ව පාසල් වලට ඇතුළත් කල යුතු බැවින් දුන්කන්නාවට යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව බල ප්‍රදේශය තුළ තිබෙන පාසල්,දේවස්ථාන, විහාරස්ථාන සියල්ල අදාල කිලෝමීටර් ගණන සමඟ අප ආයතනයේ google map එක තුළ සඳහන් වන බවත්, යම් යම් අයගේ ඕනෑ එපාකම් සපුරා ගැනීමට මෙය සිදු කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. අප ආයතනයේ සේවාව පිළිනොගන්නේ නම් එය නවතා දමමුයැයි තමන්ද පැවසූ බවත්, අප මෙලෙස පහළට යා යුතු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට වෙන්නප්පුවේ පාසල් සඳහා වෙන්නප්පුව සභාවෙන් ගන්නා ලෙසට දැනුම් දිය හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

අදාල සියළු දෙනාට මේ සම්බන්ධව ලිඛිතව දන්වා යවා ඇති බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. ඒ සිටින සංවර්ධන සමිතිය මගින් දෙමාපියන්ට නාත්තන්ඩියෙන් රැගෙන එන ලෙසට බල කරන බවත්, අපගේ google map එක සම්මුඛ පරීක්ෂණයෙන් ප්‍රතික්ෂේප කලහොත් යැයි දෙමාපියන් බිය වන බවත් ප්‍රකාශ කරන ලදී. අපේ google map එකත් සල්ලි දී ලබාගෙන නාත්තන්ඩියෙන්ද ගොස් එය ලබා ගන්නා බවත්, කුමක් හෝ වාසියක් ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් තවත් එය විධිමත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ පිළිබඳ තවත් විධිමත් කර පැහැදිලිව උදාහරණ සහිතව මිරිස්සන්කොටුව විද්‍යාලයද පෙන්වා දෙමින් දන්වන ලෙසට ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

අප විසින් ලබා දෙනුයේ poster paper එකක් බවත් නාත්තන්ඩිය මඟින් paper sheet එකක් ලබාදෙන බවත් එහිදී අප ආයතනයේ google map එක අවුරුදු ගණනකට පාසල් සන්තක කර ගැනීමටද හැකි බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

## 01.නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
- ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
- ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
- ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
- ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 ජූලි මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**2022 ජූලි මස 28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා |
| **4.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **5.** | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| **6.** | ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |
| **7.** | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |
| **8.** | ගරු මන්ත්රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2022 ජූලි මස මස 07 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |
| 6. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 8. | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2022 ජූලි මස මස 21 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය |
| 6. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 8. | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2022 ජූලි මස 19 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රීනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය |
| 7. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |

02. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රධාන බස් නැවතුම්පල, තෝප්පුව මංසන්ධිය හා ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයට අදාල පරිශ්‍රවල සනීපාරක්ෂක පද්ධති ඉතාමත් හොඳින් සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම පිළිබඳව ජනතාවගේ ප්‍රසාදයට ලක් වූ සෞඛ්‍ය කම්කරුවන් වන මානිකවේල මෝගන් මයා, පී.ඇන්ටනී රොශාන් මයා, අමිල ප්‍රසන්න මයා යන සේවක මහත්මයින් ඇගයීමේ වැඩසටහනක් පසුගිය දින පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම් මහතා ඇතුළු සියළුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

03. පසුගිය මහා සභා රැස්වීමෙන් පසුව විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සහ සූර්ය පැනල භාවිතය පිළිබඳව සූනිත්‍ය බල ශක්ති අධිකාරියේ විදුලි ඉංජිනේරු මහතා විසින් ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමෙන් අනතුරුව කාර්ය මන්ඩලය දැනුවත් කල බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

04. 2022 ජූලි මස 25 වන දින විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහනක් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කල බවත් ඩෙංගු බෝ වීම වැඩි වීඇති බවත්, ඩෙංගු රෝගීන් ප්‍රමාණයද වැඩි වී ඇති බවත්කොවිඩ්-19 රෝගයද වැඩි වෙමින් පවතින් බැවින් ඒ සඳහාද අවධානය යොමු කරන ලෙසත්

එබැවින් සතියට වරක් හෝ තම ගෙවත්ත පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙසත් පරිසරය පිරිසිඳුව තබා ගන්නා ලෙසත් දැනුම් දෙන ලදී. එමෙන්ම MOH ආයතනය මඟින් දුමායන සිදු කරන බවත් එහිදී පෙට්‍රල් සහ ඩීසල් අවශ්‍ය බවත් යම් විට ගැටළු වලටද මුහුණු දීමට සිදු වන බවත් , වයික්කාල ප්‍රදේශයේ ඩෙංගු උවදුර වැඩි වූ විට අවශ්‍ය ඉන්ධන සොයා ගැනීමට විශාල වෙහෙසක් ගැනීමට සිදු වූ බවත් එය ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ද දන්නා බවත් තමන් පෞද්ගලිකව මැදිහත් වී ඉන්ධන ගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම සිරිගම්පල 6 කොටසේ හෝ 3 කොටසේ වැඩිපුර ඩෙංගු වාර්තා වූ බවත් මෙය කෙසේ හෝ මර්ධනය කර ගැනීමට කටයුතු කරමුයැයිද මෙම වැඩසටහන සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදි.

05. 2022 ජුලි මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදි.

- බෝලවත්ත අංගම්පිටිය රණවිරු මාවතේ වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම -
- බෝලවත්ත අංගම්පිටිය රණවිරු මාවතේ ඉතිරි කොටස වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- බොරලැස්ස කිරාගාර පාර වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- බොරලැස්ස කිරාගාර පාර ඉතිරි කොටස වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- සිංදාත්‍රිය වේලන්කන්නි මාවතේ වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- ලුණුවිල පහලවත්ත දෙවන අතුරු මාර්ගය ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 470-පහළ බුජ්ජම්පොල ග්‍රාම නිලධාරී වසමේ “ ඉසුරු ප්‍රජා මණ්ඩලය” පිහිටුවීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

එක් වසමකට එක් ප්‍රජා මණ්ඩලයක් බැගින් ගමේ උදවිය සමඟ එකතු වී පිහිටුවා ගන්නා ලෙසත්, එවිට කොට්ඨාස වල වැඩ කටයුතු පහසුවෙන් සිදු කරගැනීමට හැකි වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 04<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 470-පහළ බුජ්ජම්පොල ග්‍රාම නිලධාරී වසමේ “ඉසුරු ප්‍රජා මණ්ඩලය” පිහිටුවීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

ii. වෙන්නප්පුව බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් ඉවත් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

පසුගිය දින වල වසර ගණනාවක සිට සභාව සතු වී තිබුණද භුක්ති විඳීමට නොලැබුණ ගෝගාතාගාරය තිබූ භූමිය විශේෂ අධිකරණ අවසරයකින් ලබා ගැනීමට කටයුතු කල බවත්, එදා කල පටන් වසර 50ක පමණ කාලයක සිට එය ජයකොඩි ක්‍රීඩා භූමිය භුක්ති විඳි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එහි බැඩ්මින්ටන් ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ඉදි කිරීමට අවශ්‍ය මුදලක් සංවර්ධන පදනමක් මඟින් ලබා දීමට සූදානමින් සිටින බවත්, ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ද

කොට්ඨාසය භාර ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතාද දන්නා බවත්, ක්‍රීඩාංගණයට අවශ්‍ය භූමිය සකස් කර ගැනීමට අනවශ්‍ය දේ ඉවත් කිරීම සඳහා අවසරයක් ලබාදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ක්‍රීඩා කමිටුවේ සභාපතිවරයා ලෙස මේ පිළිබඳව යමක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ඉල්ලා සිටින ලදී. ප්‍රාදේශීය සභාවක් ලෙස ක්‍රීඩාව සම්බන්ධ වැදගත් පියවර ගණනාවක් අප විසින් ගෙන ඇති බවත්,ක්‍රීඩාවට ඇති අවශ්‍යතාවය මැනවින් හැඟෙන බැවින් කිරිමැටියාන,තුලාවල, ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයට යාබදවත් ක්‍රීඩාංගණ පුළුල් කිරීම සඳහා ඉඩම් මිල දී ගත් බවත්, එලෙසම දංකොටුව ජයකොඩි ක්‍රීඩාංගණයත් පුළුල් කිරීම සඳහා ගරු සභාපතිතුමා කලෙක පටන් උත්සාහ කරන බවත්, ඒ සඳහා නැඟුණ යම් යම් බාධාද මේ වන විට ඉවත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. පෙර සැලසුම් කල පරිදි අවශ්‍ය ගෘහස්ථ ක්‍රීඩාංගණය ඉදි කිරීමට පර්චස් 80ක පමණ බිම් කොටස් එතැන තිබෙන බවත්, එමෙන්ම දිනෙන් දින බඩු මිලද ඉහළ යන බැවින් එම බිම් කොටසේ ගෘහස්ථ ක්‍රීඩාංගණය ඉදි කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරමුයැයිද ප්‍රකාශ කරන ලදී. මේ සඳහා දංකොටුව ක්‍රීඩා සංවර්ධන පදනම විසින් මෙම ගෘහස්ථ ක්‍රීඩාංගණයේ මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා ඉදිරිපත් වී ඇති බවත්, එබැවින් භූමිය සකස් කර ක්‍රීඩාංගණයට සුදුසු පරිදි එය සූදානම් කර දෙමුයැයිද ඉල්ලීම කරන ලදී.

දංකොටුව ක්‍රීඩා සංවර්ධන පදනම මඟින් ලක්ෂ 10ක මුදලක් සභාවට පරිත්‍යාග කරන බව දන්වා ඇති බවත්, එය ඇස්තමේන්තු ගත කරන බැවින් ලබන වසර වන විට 2023දී අයවැයෙහි මුදලක්ද මේ සඳහා වෙන් කරන බවත්,මෙම වැඩ කටයුතු ඉක්මනින්ම ආරම්භ කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

මෙම යෝජනාව ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා එ ස්ථිර කරන ලදී

දිනෙන් දින බඩු මිල ඉහළ යන බැවින් ඇස්තමේන්තු සකස් කර මෙම කටයුත්ත හැකි ඉක්මනින් ආරම්භ කරමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ලබන සතියේ ක්‍රීඩා කමිටුවක් පවත්වා එයට මෙම යෝජනාව යොමු කර අනුමත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ක්‍රීඩා කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට දැනුම් දෙන ලදී.

ලබන සතියේ අඟහරුවාදා දින ක්‍රීඩා කමිටුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබෙන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම මෙම භූමිය පිහිටා ඇති ආකාරය අනුව උපරිම ප්‍රයෝජනයක් ගත හැකි පරිදි එය සකස් කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

බැඩ්මින්ටන් පමණක් නොව නෙට්බෝල්,වොලිබෝල් වැනි ක්‍රීඩා සඳහාද මෙය සකස් කරමුයැයිද, එය කර්මාන්ත කමිටුවටද යොමු කරන බවත් අදම මෙම වැඩ කටයුත්ත ආරම්භ කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එතැන පර්චස් 80ක ඉඩමක් තිබෙන බවත්,මෙම ඉඩමේ ගැටළුව මතු වන විට පර්චස් 30ක පමණ කොටසක එම පුද්ගලයා පදිංචි වී සිටි බවත්,ඉතිරිය හිස් ඉඩමක් බවත්,අනෙක් පසින් අඩි 10ක පමණ කොටසක් ක්‍රීඩා සංගමය මේ සඳහා ඉල්ලූ බවත් ඒ අනුව ඇස්මේන්තු සකසා ඇති බවත් ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම දංකොටුව මහජන පුස්තකාලය වෙළඳ සංකීර්ණයේ තෙවන මහලේ තිබෙන බවත් වැඩිහිටි පිරිසට එම ස්ථානයට යාමට නොහැකි බැවින් පුස්තකාලයත් මෙම ස්ථානයට ගෙන ඒමට හැකි නම් යෝග්‍ය බවද යෝජනා කරන ලදී.

කමිටුවට යොමු කර එය ඉදිරියේදී සලකා බලමුයැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම ස්ථානය ක්‍රීඩාංගණයක් බැවින් පුස්තකාලයට පැමිණෙන පිරිසට බාධාවක් ඇති වේයැයි ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් පල කරන ලදී.

එම ලබාගත් භූමියෙන් උපරිම ආදායමක් හා ප්‍රයෝජනයක් ගත හැකි පරිදි සකස් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා ගැලපෙන පරිදි අවශ්‍යා කටයුතු සිදු කරන ලෙසත්,කමිටුවෙන් අදාල වාර්තාද ලබා දෙන ලෙසත්, කොට්ඨාස භාර මන්ත්‍රීවරයාගේ ඉල්ලීම සම්මත කල හැකිනම් එයද සම්මත කරන ලෙසත්, එමෙන්ම සේවා පියසක්ද ප්‍රාදේශීය ලේකම්තුමිය ඉල්ලන බැවින් එයද සලකා බලන ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

බහු කාර්යය සංවර්ධන යෝජනා ක්‍රමයකට යාමට හැකි නම් හොඳයැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තුලාවල ක්‍රීඩාංගණය ගෙන මාස 06ක් පමණ වන බවත්, තවමත් නාම පුවරුවක් සකස් කර නොදුන් බවත් එම ඉඩමේ අසල්වැසියන් කොහු වේලන බවත් එබැවින් ඒ සඳහා ඉක්මනින් නාම පුවරුව සකස් කර දෙන ලෙසත් තුලාවල කොට්ඨාස භාර මන්ත්‍රී ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව සොයා බලා එය සිදු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

| තීරණ අංක 05 |
|---|
| වෙන්නප්පුව බල ප්‍රදේශය තුල අනවසරයෙන් ඉදි කර ඇති සියළු ඉදි කිරීම් ඉවත් කිරීමටත්,සභාවට අයත් දංකොටුව උප කාර්යාල බල ප්‍රදේශයේ ජයකොඩි ක්‍රීඩාංගණයට අයත් භූමි කොටසක අනවසරයෙන් ඉදිකර ඇති ඉදි කිරීම් ඉවත් කිරීමටත්, මෙම භූමි කොටසේ අනවසර පදිංචිකරුවන් ඉවත් කර භුක්තිය සභාවට භාර දී ඇති බැවින්ද, ලි.ප.අ.වප/පුදි/දන්/86-2016 දරණ දංකොටුව ක්‍රීඩා සංවර්ධන පදනම විසින් මෙම භූමියේ ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් ඉදිකර දෙන ලෙස හා ඒ සඳහා රුපියල් ලක්ෂ 10කට ආසන්න මුදලක් එම පදනම මඟින් පරිත්‍යාග කරන බවත් ලිඛිතව දන්වා ඇති බැවින්ද, බල ප්‍රදේශයේ පාසල් දරුදැරියන් හා ක්‍රීඩා සමාජ වෙත මෙයින් ඉමහත් ප්‍රයෝජනයක් ගත හැකි බවත් මෙය බල ප්‍රදේශයේ ක්‍රීඩා කෞෂල්‍යා නඟා සිටුවීම සඳහා සභාවෙන් සිදු කල හැකි විශාල මෙහෙවරක් බවත් සාකච්ඡා කරන ලද අතර මෙම භූමිය තුල ඇති අනවසර ඉදි කිරීම් ඉවත් කර ක්‍රීඩාංගණය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන සේ පිළිසකර කිරීම සුදුසු බවටද, දංකොටුව ක්‍රීඩා සංවර්ධන පදනමේ ඉල්ලීම පිලිගෙන ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ඉදි කිරීමට කඩිනමින් පියවර ගත යුතු බවද තීරණය කරන ලදී. ඒ අනුව මෙම ජයකොඩි ක්‍රීඩාංගණයට අයත් භූමි කොටසේ අනවසර ඉදි කිරීම් ඉවත් කර ක්‍රීඩාංගණය නිසි පරිදි සකස් කිරීමටත් ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ඉදි කිරීම සුදුසු බවටත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී. |

## **04. කාරක සභා වාර්තා සලකා බැලීම.**

i. 2022.07.28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලීම.

| තීරණ අංක 06 |
|---|
| 2022.07.28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරී අයිරංගනී පෙරේරා මහත්මියගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2022.07.19 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම.

| තීරණ අංක 07 |
|---|
| 2022.07.19 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතාගේ |

| |
|---|
| යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022.07.07 සහ 2022.07.21 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම

ඇස්තමේන්තු නව රේට්ස් යටතේ අනුමත කරන බවත් නමුත් ඒවා ක්‍රියාත්මක කිරීමට ලිඛිත අනුමැතියක් ලැබී නොමැති බවට කමිටුවේ සාකච්ඡා වූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවේ තිබෙන මුදල් ප්‍රමාණය අනුව වැඩ කටයුතු කර ගෙන යාමට තීරණය කර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් චක්‍රලේඛයක් මඟින් සංවර්ධන වැඩ කටයුතු වලට මුදල් නොගෙවන ලෙස දන්වා තිබෙන බවත්, එය ලිඛිතව ලැබී නොමැතිව වාචිකව පවසා ඉදිරියේදී ගෙවූ පසුව ගැටළුවක් මතු වුවහොත් කුමක් කරන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මුළු රටටම තීරණයක් ගැනීමේදී ගැටළුවක් තිබෙන බවත්, බල ප්‍රදේශයක් ලෙස බදු මුදල් ලැබී යන බවත්, මෙම ප්‍රාදේශීය සභාව තුළ තිබෙනුයේ මෙම බල ප්‍රදේශයේ ජනතාවගෙන් ලැබෙන මුදලක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය අප ප්‍රාදේශීය සභාවට පමණක් තිබෙන දෙයක් නොවන බවත් , එය සියළුම පලාත් පාලන ආයතන වලට තිබෙන දෙයක් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. වැඩ විශයන් ටෙන්ඩර් කර තිබෙන බවත්,ඒවාට ගෙවූ පසුව ඉදිරියේදී ගැටළුවක් පැමිණියහොත් කුමක් කරන්නේදැයිද විමසා සිටින ලදී.

චක්‍රලේඛයේ තිබෙන දේ පිළිබඳව දැනුවත් කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මේ සම්බන්ධව සත්‍ය දැනුවත් කල යුතු බවත්, මුදල් අමාත්‍යාංශය මඟින් චක්‍රලේඛය එවූ බවත්, මුදල් අමාත්‍යාංශය හෝ වෙනත් ඕනෑම අමාත්‍යාංශයක් මඟින් එවනු ලබන චක්‍රලේඛයක් වයඹ පලාත් සභාව මඟින් වැළඳගත හොත් එම චක්‍රලේඛය ඒ ආකාරයෙන්ම වයඹ පලාත් සභාවට අදාල වන බවත්, ඒ අනුව මෙම මුදල් චක්‍රලේඛය ආණ්ඩුකාරතුමා විසින් වයඹ පලාත් සභාවට අදාල කර වැලඳගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එවිට මේ අනුව කිසිඳු මුදලක් වැය කිරීමට නොහැකි වන බවත්, සභාව සතු වත්කම් සමඟ මෙම වැඩ කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියක් ලබාදෙන ලෙසට කොමසාරිස්තුමාට ඉල්ලීමක් කල බවත් එම අනුමැතිය තවමත් නොලැබී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙහි ගැටළුවක් තිබෙන බවත් ගෙවීම් කිරීමේදී එම ගැටළුව මතු වන බවත් එබැවින් ගෙවීම් වලට පෙර එම අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමාද උත්සාහ කරන බවත් එබැවින් එම චක්‍රලේඛය අප සභාවට අදාල බවත් ප්‍රකාශ කරන ලදී. ආණ්ඩුකාරතුමා විසින් අදාල කරගත් එම ලිපිය කර්මාන්ත කමිටුවටද යොමු කල බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

තමන් ලබන සතියේ ආණ්ඩුකාරතුමාව හමු වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

හැකි ඉක්මනින් එය අනුමත කර ගැනීමට සිදු වන බව ලේකම්මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය දින මුදල් කමිටුවේ සහා අරමුදලින් සිදු කරන කර්මාන්ත සඳහා ටෙන්ඩර් අනුමත කර තිබෙන බවත්, මින්පෙර අනුමත කල කර්මාන්තද තිබෙන බවත්, ඒවාට අනුමැතියක් නොමැති බව පැවසුවද ඒවාට පසුව ඇමූ කර්මාන්ත සඳහා මුදල් කමිටුවෙන් ටෙන්ඩර් අනුමත කර තිබෙන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සියළුම කර්මාන්ත නව රේට්ස් යටතේ ඇස්තමේන්තු ගත කර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මීට කර්මාන්ත කමිටු දෙකකට පමණ පෙර අනුමත කල කර්මාන්ත ටෙන්ඩර් කර නොමැති බවත්,සමිති වලට අත්සන් කිරීමටවත් ඉඩ ලබා දී නොමැති බවත් වැඩ අධිකාරී මහතා විසින් මේවාට ලිඛිත අනුමැතියක් නොමැතිව තීරණයක් ගැනීමට නොහැකි බව පැවසූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් අනුමැතිය ගෙන එන තෙක් මෙම වැඩ කටයුතු සිදු කිරීමට අවසරය ලබා දී තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය වැරදි බවත්,අනුමැතිය ලබා නොදුනහොත් කුමක් කරන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

එය ලබා දෙන බවත්, තමන් මෙය සිදු කරගෙන යන ලෙසට පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් අනුමත කල සියළුම ඇස්තමේන්තු ලබන සතියේ සිටම ක්‍රියාත්මක කරන ලෙසත්,සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහනේදීද මෙලෙසම කටයුතු කල බවත් මේ වන තෙක් කෝටි ගානක් ලැබී නොමැති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සාමාන්‍යයෙන් කොන්ත්‍රාත්කරුවන් මේ වන විට ඉදිරිපත් නොවන බවත්, පරණ කොන්ත්‍රාත්කරුවන්ටත් කිරීමට නොහැකි බව පවසන බවත්, නව කොන්ත්‍රාත්කරුවන් බිහි වී නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නව රේට්ස් අනුව සංශෝධනය කල ඇස්තමේන්තු තිබෙන බවත්, එම රේට්ස් පලාත් සභාව මඟින් එවූ බවත්, ඒ අනුව ඇස්තමේන්තු සෑදූ බැවින් එ් සඳහා විරුද්ධ වීමට ඔවුන්ට නොහැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මීට පෙර අනුමත කල ඇස්තමේන්තුද තිබෙන බවත්,ලබන සතියේ සිටම මෙම කටයුතු ආරම්භ කරන ලෙසත්,බොහෝ කොට්ඨාස වල ඇස්තමේන්තු තවමත් අනුමත කර නොමැති බවත්, මේ වන විට මාස 08ක් පමණ ගෙවී ගොස් ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

නව රේට්ස් අනුව සකස් කල ඇස්තමේන්තු වල කර්මාන්තයන්හි වැඩ කටයුතු ආරම්භ කිරීමට තමන් පවසා ඇති බවත්, අදාල කොට්ඨාසයේ වැඩ විශය කොන්ත්‍රාත්කරුවන් සමඟ ආරම්භ කරන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

එය කර්මාන්ත අංශයට දැනුම් දෙන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අද දින මහා සභාව අවසානයේ කර්මාන්ත කමිටුව පැවැත්වෙන බවත්, ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පැවසූ දෙයෙහි හරි දෙයක් තිබෙන බවත්,කමිටුවට සියළුම නිලධාරීන්ට පැමිණෙන ලෙසට පවසන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. කර්මාන්ත කමිටුව පැවැත්වෙන දිනයට වෙනත් වැඩ කටයුතු වලට නිලධාරීන් යොමු නොකරන ලෙසට ද ප්‍රකාශ කරකන ලදී.

මුදල් කමිටුවට සියළුම නිලධාරීන් ගෙන්වා ගන්නා බවත්,නමුත් කර්මාන්ත කමිටුවට සහභාගි නොවන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

පරිසර කමිටුවටද එය එසේම බවත්,වෙනත් ආයතන වල නිලධාරීන් පැමිණෙන බවත්, නමුත් සභාවේ නිලධාරීන් සහභාගී නොවන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තිබෙන වැඩකටයුතු සමඟ යම් විට නිලධාරීන් රාජකාරී කටයුතු වල නිරත වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 08

2022.07.07 සහ 2022.07.21 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාතාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## <u>05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.</u>

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 ජුනි**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 ජුනි**

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව වරිපනම් වැඩ කටයුත්ත සඳහා දස දෙනෙකු යොමු කර තිබෙන බවත්,එම කටයුතු අගෝස්තු මාසය වන විට අවසන් කර ක්‍රියාත්මක කරන බව පැවසූ බවත් එහි ප්‍රගතිය විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව වරිපනම් කලාප සිතියම් ගත කිරීම හා වරිපනම් ඒකක සමීක්ෂණය සඳහා සේවකයින් දස දෙනෙකු බඳවා ගත් බවත් එම සේවකයින් මඟින් වෙන්නප්පුව සභාවට වරිපනම් කලාප GIS තාක්ෂණය උපයෝගී කර ගනිමින් නිවැරදිව මැනුම් කර මේ වන විට වරිපනම් කලාප හතරක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති බවද පවසන ලදී.

එමෙන්ම සෑම පලාත් පාලන ආයතනයකට අයත් සියළුම මාර්ග සමීක්ෂණය කර GIS තාක්ෂණය මඟින් සිතියම් ගත කිරීම සඳහා පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් මත පලාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද දැනුම් දීම මත මෙම නිලධාරින් යොදවා මෙම සභාවට අයත් සියළුම මාර්ග සමීක්ෂණ කටයුතු සිදු කරන ලද බවත්, ඒ අනුව මෙම සභාවට අයත් මාර්ග 4013ක් 2022-ජුනි මස 10 දින ගැසට් පත්‍රයේ පලමුවර ප්‍රකාශයට පත් කිරීමට හැකි වූ බවද, ජුනි 10 දින සිට මාස 03 කාල සීමාවක් ඇතුළත විරෝධතා ඉදිරිපත් කල හැකි බවත් එසේ විරෝධතා ඉදිරිපත් වුවහොත් ඒ පිළිබඳව කමිටුවට යොමු කර ඉදිරි කටයුතු සඳහා ක්‍රියා කරන බවද ඉන්පසු නැවත නිවැරදි මාර්ග ලේඛණය ගැසට් පත්‍රයේ පල කරන බවද එසේ දෙවෙනි වර ගැසට් කිරීමෙන් පසුව එම ගැසට් පත්‍රයේ සඳහන් සියළු මාර්ග සභාව සතු බවත් ඉන්පසු එම මාර්ග සම්බන්ධයෙන් සියළු නීත්‍යානුකූල කටයුතු කිසිදු ගැටළුවකින් තොරව සභාව මඟින් ක්‍රියාත්මක කල හැකි බවද ප්‍රකාශ කරන ලදී.

මේ වන විට වරිපනම් සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බවත්, මෙතෙක් වෙන්නප්පුව සභාවට අයත් වරිපනම් කලාප හතරටම හඳුනාගෙන වරිපනම් බදු අය කරනු ලැබුවේ වරිපනම් ඒකක 7600කට ආසන්න ප්‍රමාණයකින් බවත්, එයින් වෙන්නප්පුව බල ප්‍රදේශයේ වරිපනම් ඒකක 1700ක් පමණ ප්‍රමාණයක් සඳහා බදු අය කල බවද, දැනට මෙම සමීක්ෂණය තුළ වෙන්නප්පුව බල ප්‍රදේශයේ පමණක් වරිපනම් ඒකක මේ වන විට 7000ට වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන ඇති බවද මෙම සමීක්ෂණය තුල සමස්ථ බල ප්‍රදේශයේම සමීක්ෂණ කටයුතු අවසන් වීමේදී වරිපනම් ඒකක 30,000කට වැඩි වනු ඇතැයි අපේක්ෂා කරන බවද ඒ තුල සභාවට විශාල වරිපනම් බදු ප්‍රමාණයක් ලැබෙන බවද ප්‍රකාශ කරන ලදී.

මෙම විස්තරය අළුත් දෙයක් නොවන බවත්, මේ මාසයේ වැටුප් සඳහා රු.12,528,886.96ක්ද ගිය මාසයේ රු.12,397,764.07 ගෙවා ඇති බවත් , මෙහි ප්‍රගතිය තමන් විමසූ බවත් කොලින්ජාඩිය පමණක් අවසන්

යන තොරතුර තමන් බලාපොරොත්තු නොවූ බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී කරුණු කාරණා කීපයක්ම ලේකම් මහතා විසින් ඉදිරිපත් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අගෝස්තු මාසය වන විට අවසන් කරන බව පැවසූ බවත්, 1998දී හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ කාලයේදි ගැසට එක පැමිණි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය ගැසට් කර නොතිබුණ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගැසට් කර තිබෙන බවත්, එය තමන් සතුව තිබෙන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.ඒ සඳහාම කණ්ඩායමක් පත් කර යොමු කලේ නම් කොලින්ජාඩිය පමණක් අවසන් කර තිබෙන්නේ කෙසේදැයිද, අගෝස්තු මාසය වන විට සියල්ලම අවසන් කරන බව පැවසූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව බල ප්‍රදේශය තුළම ඒකක 7600 පමණ හඳුනාගෙන තිබූ බවත්, මේ වන විටත් දස දහසක් එක් කොට්ඨාසයකින් පමණක් වරිපනම් ඒකක 7000කට වැඩියෙන් හඳුනාගෙන තිබෙන බවත් නොවැම්බර් මස වන විට ගැසට් කිරීමට බලාපොරොත්තු වන බවත් ඒකක 30,000 පමණ සමස්ථ බල ප්‍රදේශය තුළින් බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලේකම්මහතා කරුණු පවසාගෙන යාමේදී කුඩා පරස්පරයක් විග්‍රහයේ තිබූ බවත්, කොලින්ජාඩිය අවසන් බවත් මේ වන විට වෙන්නප්පුව හා දුම්මලදෙණිය යන කොටස ආරම්භ කර ඇති බවත් එය නොකියවුන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ජනවාරි මාසයේ සිට ආදායම වැඩි වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පොතේ සඳහන් වී තිබෙන ලේඛණය අනුව මෙම කර්තව්‍යය සිදු කිරීමට නොහැකි බවත්,ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාද මේ සම්බන්ධයෙන් දන්නා බවත්,උදාහරණයක් ලෙස උළු මෝල් පද්ධතිය ගතහොත් වරිපනම් වලින් නිදහස් කිරීමට ඉදිරිපත් කල ස්ථාන පමණක් මහා සභාවට යොමු කර අනුමැතිය ගත් බවත්, මෙම යන කන්ඩායමට ඇති සහ මියගිය, ගොඩනගා ඇති සියල්ල සලකා බැලීමට සිදු වන බවත් අප මෙතැන සිට පැවසුවද එම වේගයට යාමට ඔවුන්ට නොහැකි බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.තොරතුරු ගැනීමට අදාල ස්ථානයට හෝ ව්‍යාපාරයට යාමටම සිදු වන බවත්, සෙනසුරාදා,ඉරිදා සහ පසුගිය දින වල සිකුරාදා නිවාඩුවද අතහැරි බවත්,සේවයට වාර්තා කිරීමත් සමඟ මෙම කටයුතු වලට නිරත වූ බවත් ප්‍රකාශ කරන ලදී. අදාල ටැක්ස් එක ප්‍රකාශයට පත් කිරීම පෙර එකඟතාවයක් ගතයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එම අවස්ථාවට තවම නොපැමිණි බවත්,දැනට ඇති වරිපනම් ඒකක 7600තුළද අත හැරිය යුතු ස්ථාන තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

සීමා නිර්ණයකර තිබෙන ප්‍රදේශයේ එක් ගෙයක් නැර හිස් ව්‍යාපාරයක් නැර මෙම පිරිස පයින් ඇවිද යන බවත්,ඒ ගොස් එම අදාල පුද්ගලයින්ව හමු වී අදාල තොරතුරු ලබා ගෙන සිතියම ඇඳගෙන යන බවත්, මේ සඳහා යම් කාලයක් ගතවුවත්, වියදමක් දැරුවත් නැවතත් වසර 50ක් පමණ යන තෙක් කිසිදු බාධාවකින් තොරව වරිපනම් පිලිබඳ කටයුතු පවත්වාගෙන යා හැකි බවත් ලේකම් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

යම් විට ඔප්පුවේ පිටපතක් ඉල්ලන විට ජනතාව ලබානොදෙන බවත්, යම් පුද්ගලයින් එය ලබා දීමට බිය වන බවත්, ඉන් පසුව තමන්ට කතා කර විමසන බවත්,තමන්ට එම දුරකථන ඇමතුමට පිළිතුරු දීමට නොහැකි වුවහොත් ඔප්පුව තබාගෙන සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ජනතාවද සත්‍ය තොරතුරු ලබානොදෙන බවත්,නිලධාරීන් සමඟ යම් පිරිස බහින්බස් වීමට පැමිණෙන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවක් ලෙස ඕනෑම කෙනෙක් ගෙන් කැඳවා තොරතුරු ගැනීමට අයිතියක් තිබෙන බවත්, ඔප්පුව එම අවස්ථාවේ පෙන්වීමට නොහැකි නම් සභාවට ඇවිත් ලේකම්මහතාට පෙන්වන ලෙසට නිලධාරීන් අතෙහි ලිපියක් යවන ලෙසත් එවිට ඔවුන් කැමති නම් එම අවස්ථාවේ පෙන්වාවියැයිද නැතිනම් සභාවට පැමිණ රස්තියාදු වී පෙන්වාවියැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙතෙක් සිදු කරඇති පාරවල් ඉදිරිපත් කිරීමට තිබෙන තොරතුරු යනාදීය PDF file එකක් මගින් මන්ත්‍රීවරුන්ගේ whatsapp group එකට යොමු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

තොරතුරු රැස් කරන විට දුරකථන අංකය ගතහොත් ඔවුන්ට ගෙවීමට ඇති මුදල සඳහන් කර කෙටි පණිවිඩයක් යැවීමටත් සිහි කැඳවීම් යැවීමටත් හැකි වන බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ජූනි මස වාර්තා වල ණයගැතියෝ රු. 133,225,738.68ක්ද , ණයහිමියෝ රු.51,257,810.78ක් තිබෙන බවත්, මුළු ලැබීම් එකතුව රු.301,916,386.33ක් ගෙවීම් එකතුව රු.280,091,227.97ක් ද තිබෙන බවත් ලක්ෂ 200ක පමණ අතිරික්තයක් තම ගණනය අනුව අප සතුව තිබෙන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. තමන් මේ පිළිබඳව මුදල් කමිටුවේදීද විමසීමක් කල බවත් සභාව ටෙන්ඩර්කරුවන් මගින්පොදු දේපල බදු දීමේදී ඇප තැන්පතුවක් ගන්නා බවත් එය ඔක්තෝම්බර් මාසය වන විට මාසික ගෙවීම අතහැර ඇප තැන්පතුවෙන් අඩු කර ගන්නා ලෙසට ඔවුන් පවසන බවත් මස්කඩ වල එලවළු කඩවල පිරිස එසේ පුරුදු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එම ඇප තැන්පතු මුදල වාර්ෂිකව ගණනය කර මුදල් කමිටුවේදී පවසන ලෙසටද ඉල්ලා සිටින ලදී. එම ඇප තැන්පතු මුදල අවසන් ශේෂයෙන් අඩුවිය යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ වන විට ගිවිසුමක් අත්සන් නොකර ටෙන්ඩර් ලබානොදෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වරදක් නොව අයවැයට ඇප තැන්පත් මුදලක් සමඟ ගණනය කොට සාදන බවත්,ඔක්තෝම්බර් මාසය පමණ වන විට ලක්ෂ 200 පමණ අතහැරීමට සිදු වන බවත් එම ගැටළුව වාහන සඳහාද තිබෙන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව දේපල බදු දීමේදී ඇප තැන්පතුවක් තබා ගන්නා බවත්, ඇප තැන්පතුව අරමුදලට ගෙන ගරු මන්ත්‍රීතුමා පැවසූ පරිදි අවසන් මාස කීපයේ එම මුදල හිලව් කර ගැනීමට බොහෝ දෙනා උත්සාහ කරන බවත් නිවැරදි ක්‍රමවේදය නම් බදු ලබා ගන්නා දේපල සඳහා ජනවාරි 01 දිනට පෙර ඇප තැන්පත් ගෙවිය යුතු බවත් එම ඇප තැන්පත් මුදල ස්ථාවර ගිණුමක වසර අවසන් වන තෙක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එම නිවැරදි ක්‍රමවේදය යම් යම් හේතු කාරණා නිසා ක්‍රියාත්මක වී නොමැති බවත්, ලබන වසරට නිශ්චිතවම එම ඇප තැන්පත් මුදල් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර දෙසැම්බර් 31 නිදහස් කරන බවත් එය කපා හැරීමක් හෝ හිලව් කිරීමක් සිදු නොකරන බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන විටත් නඩු දමා ඇති බවත්,ගිවිසුම් නීතිය අනුව මාස දෙකක් හිඟ මුදල් ගෙවීම සඳහා ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.මාස දෙකක් ඇතුළත හිඟ මුදල් ගෙවීම් නොකලහොත් නඩු දමන බවත් ඉන්පසුව නීත්‍යානුකූල වැඩ සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.සියලුම අංශ නිවැරදි කරගෙන පැමිණි බවත් තවත් යම් යම් දේද ඉතිරි වී ඇති හෙයින් ඒවාද නිවැරදි කරන බවත් තවදුරටත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

එය ලබන වසරේ සිට ක්‍රියාත්මක කරන බව ලේකම්මහතා පැවසූ බවත්, නමුත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසනුයේ මෙතෙක් එහි සිදු වී ඇති වාසිය හෝ අවාසිය පිළිබඳව බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය මුදල් කමිටුවට ලබාදෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම ඇප තැන්පතු මුදල් පොදු තැන්පතු ගිනුමක නොතිබෙන්නේ දැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

පොදු තැන්පතු ලෙස ගිනුමක් නොමැති බවත්,සභාවේ අරමුදල් සඳහා එක් ගිණුමක් පමණක් ඇති බවත්, මෙය අනිවාර්යය ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කල යුතු බවත් එවිට මුදලද ආරක්ෂා වන බවත් එමෙන්ම එම මුදල සඳහා පොළියද සභාවට ආදායමක් ලෙස ලැබෙන බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

මස්කඩ හිමියන් එම කටයුත්ත සඳහා හුරු වී සිටින බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 09<br><br>2022 වර්ෂයේ ජූනි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ 2022 වර්ෂයේ ජූනි මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය |

සභාව සතු ඉඩම් තහවුරු කිරීමේ ලිපියක් එවා ඇති බවත්,එහි යම් යම් ඒවා වැරදි බවත් සංශෝධනය විය යුතු ස්ථාන තිබෙන බවත් ගරු උපසභාපතිතුමාගේ කොට්ඨාසයට අයත් වන ඒවාද තමාට වැටී ඇති බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය නිවැරදි තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා එම ලිපිය ඉදිරිපත් කල බවත්, මෙතෙක් සභාවේ ඉඩම් පිළිබඳ නිවැරදි සමීක්ෂණයක් නොතිබූ බවත්, සභාවේ ඉඩම් සියල්ල හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කල බවත්, තොරතුරු නිවැරදි කර ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වසර 10කට 20කට පෙර ඔප්පුවල තිබෙන ලෙස සඳහන් වී ඇති බවත් මේ වන විට කොට්ඨාස බෙදා ඇති බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන්ගේ කොට්ඨාසයේ ඉඩම් 09ක් තිබෙන බවත්, එහි සඳහන් නොවන පොදු ළිං වලට අදාල 1972 ගම් සභාවට පවරා දුන් ඉඩම් කොටස් 03ක පත්තිරු තිබෙන බවත් ඒවාද ගෙන ඔප්පුව සකස් කර ගන්නා ලෙසට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වනුයේ මෙවැනි සහයෝගයක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

iii. 2022 ජූලි මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

iv. 2022 වර්ෂයේ ජූලි මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

අද වන විට බල්බ සම්බන්ධ ගැටළුවක් තිබෙන බවත්, පසුගිය දිනවල රු.600.00 ගණනක් යටතේ බල්බයක් මිලදී ගත් බවත්, මේ වන විට රු.1280.00 පමණ වන බවත් නමුත් වගකීම් කාලයක් ද ඒ සඳහා නොදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. සභාව මගින් බල්බ ඕඩර් කලද ඒවා නොමැති බවද පවසන බවත්, මාසයකට එක් දිනයක් පමණක් එක් කොට්ඨාසයකට වෙන් කර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.බල්බ 500 පමණ මේ වන විට ඕඩර් කර ඇති බවත්, පරණ සැපයුම්කරු විසින් CFL බල්බ 1300ක් පමණ ලබා දීමට ඇති බවත් එයද ලබා නොදුන් බවත් LED return බල්බද 150ක් පමණ ලැබීමට තිබෙන බවත් LED බල්බයේ සාර්ථකත්වයක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. බල්බ ලැබුණු වහාම චෙක්පත ලබාදීමේ කොන්දේසිය මත බල්බ මේ වන විට ලබා ගත යුතු බවත් අද වන විට සෑම භාණ්ඩයක්ම එලෙස ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ලංකාවේ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩයක් විකුණන්නේ නම් ඒ සඳහා අනිවාර්යයෙන්ම වගකීම් සහතිකයක් නිකුත් කරන බවත්, එය නැතිනම් නඩු දැමීමට හැකි බවත්, වගකීම් සහතිකයක් නොමැතිව එම භාණ්ඩ විකිණීම තහනම් බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කර ලදී. එම නිසා පැන යාමට ඔවුන්ට නොහැකි බවත්,නීතිමය පියවර ගනිමුයැයිද අඩුම තරමින් එන්තරාවාසියක් හෝ ඔවුන්ට යවන ලෙසත් සභාවට මේ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

එම ආයතන කුමක්දැයි ගරු මන්ත්‍රී සී.පි.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙහිදී ආයතන දෙකක් තිබෙන බවත්,එක් ආයතනයක තොරතුරු ගබඩාවෙන් ගත හැකි බවත්,අනෙක් ආයතනය මිෂෙල් ඉන්ඩස්ට්‍රීස් බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

පසුගිය දින එම මිෂෙල් ඉන්ඩස්ට්‍රීස් ආයතනය පමණක් ඉදිරිපත් වී ටෙන්ඩර් දමා තිබූ බව ගරු මන්ත්‍රී සී.පි.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

අප විසින් මිල ගණන් ඉල්ලූ ආයතන වලින් පමණක් මිල ගණන් ඉදිරිපත් කරන බවත්,අප සභාව සමඟ සම්බන්ධකම් නොපවත්වන විදුලි උපාංග අලෙවි කරන ආයතන විශාල ප්‍රමාණයක් ඇති බවත්, එම ආයතනද අප විසින් සොයා ගත යුතු බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

පත්තරයේ මේ සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි වන ලෙස සඳහන් කර දැන්වීමක් පල කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මිෂෙල් ඉන්ඩස්ට්‍රීස් ආයතනය මඟින් භාණ්ඩ ලබා දී ඇති බවත්, එවිට ඔවුන් ගිවිසුමක් අත්සන් කරන බවත් එබැවින් ඔවුන්ට මේ සඳහා කාල සීමාවක් ලබා දී එම කාල සීමාව අවසන් වූ පසුව නඩු දමමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙවර ඔවුන්ගෙන් බල්බ ගෙන ගෙවීම් නවතාගෙන සිටිමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් විසින් තම අදහස් පල කරන ලදී.

බල්බ නොමැති බැවින් ආයතන කීපයකටම තමන් පසුගිය දින කතා කල බවත්, මෙම මිෂෙල් ආයතනය ලබා දී ඇති මුදලට වඩා වැඩි ගණන් එම ආයතන මඟින් පැවසූ බවත් එබැවින් අඩු මුදලට බල්බ ගත හැකි ආයතනයක් තිබේ නම් තමන්ව ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

හාල් කිලෝවක මිල කොපමණ වුවද අප බත් නොකා නොසිටින බවත් එලෙසම අවශ්‍යතාවය තිබෙන බැවින් බල්බයක මිල එක් දහස් ගණනක් වුවත් අපට ගැනීමට සිදු වන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

බල්බයේ තත්ත්වයත්,අප ආයතනයේ ගිවිසුම් වලටත් අදාල ආයතන කැමති විය යුතු බවත්, අපගේ ඉල්ලීම් වලට ආයතන විසින් භාණ්ඩ ලබානොදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.දිගු කාලයක සිට මෙම විෂය සිදු කරගෙන යන බවත් ආයතන ද මාරු කල බවත් නමුත් මිල ගණන් සමඟ මෙම පුද්ගලයාම නැවත තේරී පත් වී පැමිණි බවත් CFL බල්බය මොහු විසින් නිවසේදී සාදන බවට තොරතුරු ලැබුණු පසුව එය ද නිලධාරීන් ලවා අධීක්ෂණය කල බවත් දැනුත් වෙනත් සැපයුම්කරුවෙකු ගෙන මෙම පුද්ගලයාව ඉවත් කරන්නේ නම් කැමති බවත් නමුත් ඒ සඳහා නව සැපයුම්කරුවෙකු ඉදිරිපත විය යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

අත්පිට මුදලට භාණ්ඩ ලබා ගැනීමට අපට මේ වන විට හැකි නම් වෙළඳපොලේ අවම මිල ගණන හා වැඩිම වගකීම් කාලය තිබෙන ආයතනයක් තෝරාගෙන බල්බ මිල දී ගනිමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සැපයුම් නිළධාරීන්ට කොළඹ ගොස් ආයතන වලින් නව මිල ගණන් ගෙන එන ලෙසට තමන් මේ වන විටත් දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් විසින් කෙවිල්ටන් සහ ඔරේන්ජ් යන ආයතන වල දුරකථන අංක දෙකම ගරු සභාපතිතුමාට ගෙනැවිත් දුන් බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

කෙලින්ම අදාල ආයතනයෙන්ම මිල දී ගනිමුයැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් කමිටුවේදී පැවසූ බවත් එලෙස එම කටයුතු කරමුයැයිද ගරු මන්ත්‍රී සී.පි.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එලෙසද ආයතන වලින් ගෙන බල්බ ප්‍රමාණයක් ලබා දීමට තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එයට හේතුව වනුයේ ගිවිසුම්ගත නොවීම බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එලෙස භාණ්ඩ මිල දී ගනිමුයැයිද ඒ පිළිබඳව සොයා බලන ලෙස ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). වයික්කාල සාන්ත බෙනඩික් දේවස්ථානයට වසර සියයක් පිරීම නිමිත්තෙන් එහි ජුබිලිය සැමරීම සඳහා මෙවර වාර්ෂික මංගල්‍යය විශේෂ වැඩ සටහන් යටතේ උත්කර්ෂවත්ව පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් එහි වීදී යන අභ්‍යන්තර මාර්ග පිළිසකර කර දෙන ලෙස ඉල්ලා එම දේවස්ථානයේ පියතුමන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම අනුව එම මාර්ග දෙක ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කර දීම සුදුසු බවට ගරු සභාපතිතුමාගේ යෝජනාව සලකා බැලීම.

තීරණ අංක 10

වයික්කාල සාන්ත බෙනඩික් දේවස්ථානයට වසර සියයක් සපිරීම නිමිත්තෙන් ජුබිලි සැමරුම් වැඩ සටහන් යටතේ මෙවර මංගල්‍යය පැවැත්වීමට කටයුතු කර ඇති බැවින්ද, මෙය ප්‍රදේශයේ පවතින විශාල ජනතාවක් සහභාගී වන දේවස්ථානයක් බැවින්ද, එහි වීදි යාමට අවශ්‍ය අභ්‍යන්තර මාර්ග දෙක සභා අරමුදලින් ප්‍රිමික්ස් ඇතිරීම සුදුසු බවත්, එය දේවස්ථානයේ අභ්‍යන්තර මාර්ග පද්ධතියක් බැවින් ඒ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමා මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(ii).ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව අප සභාවේ ජ්‍යේෂ්ඨ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ නැන්දණිය , බිරිඳගේ මව අප අතරින් පසුගිය දින වසර 76ක් ආයු වළඳා වෙන් වූ බවත් ඒ සඳහා ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාව ඉල්ලා සිටින ලදී. කුමාරි රත්නායක මහත්මිය අප ප්‍රදේශයේ ප්‍රගතිශීලී කාන්තාවක් බවත් විශේෂයෙන්ම එතුමියගේ ස්වාමිපුරුෂයා වන නෙවිල් ප්‍රනාන්දු මහතා හිටපු දිවන්ගත පාර්ලිමේන්තු මන්ත්‍රී ,නීතිඥ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මහතාගේ ආදරණීය සහෝදරයා බවත් මෙතුමිය අප සභාවේ ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ ආදරණීය ලොකු අම්මා බවත්, එමෙන්ම වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ පියා වන එරික් ප්‍රනාන්දු යන මහතාගේ සහෝදරයාගේ බිරිඳ බවත් එබැවින් දංකොටුව ප්‍රදේශයේ විශාල දේශපාලන ඉතිහාසයකට හිමිකම් පවසන පවුලක ප්‍රගතිශීලී කාන්තාවක් බවත් ප්‍රකාශ කරන ලදී.එතුමියගේ අභාවය පිළිබඳව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ශෝක ප්‍රකාශ යෝජනාවක් සභා ගත කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී. මෙම ශෝක ප්‍රකාශය අප සභාවේ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුටම සම්බන්ධ වන නිසා ආදරණීය පවුලේ සාමාජිකයින්ට එය දන්වා යවන ලෙසත් ඉල්ලා සිටින ලදී.

තීරණ අංක 11

ජ්‍යේෂ්ඨ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ නැන්දණිය වන කුමාරි රත්නායක මහත්මියගේ අභාවය වෙනුවෙන් එතුමියගේ ඥාතීන් වෙත ශෝක පණිවිඩයක් යැවීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්..ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(iii).ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාගේ කොට්ඨාසයේ පාරක් සංවර්ධනය කර ඇති බවත්, ඒ පිළිබඳව විමසීමක් කල යුතු බවත්, මන්ද එය එක් නිවසකට පමණක් යන මාර්ගයක් බවත් ප්‍රකාශ කරන ලදී.ඒ සඳහා වෙන් වූ ප්‍රතිපාදන පිළිබඳවද විමසා සිටින ලදී.

එය ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජනා කර කර්මාන්ත කමිටුව මඟින් අනුමත වී ඇති පාරක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම මාර්ගය අමල් මඩප්පුලි නම් පුද්ගලයාගේ නිවසට පමණක් යන මාර්ගයක් බව ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

දැනට ගේට්ටුව තිබෙනුයේ එම නිවසට යාමට පමණක් බවත්, එම මාර්ගයේ නිවෙස් තුනක් පමණ තිබෙන බවත් දැනට ඔවුන් වෙනත් ගේට්ටු භාවිතා කරන බවත් එමෙන්ම මෙම මාර්ගය ඍජු ශ්‍රම යටතේ සාදා ඇති බවත් ගිය වසරේ ඉතිරි වී තිබූ මුදල් වලින් එමෙන්ම ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ ප්‍රතිපාදන වැඩි හරියක එහි ඇතුළත් වී ඇති බවත් මෙම මාර්ගය සෑදීම සඳහා ඉල්ලීමක්ද කර තිබූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එක් පසෙකින් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ නිවසද, අනෙක් පසින් තවත් ඉඩමක්ද, මැදින් අමල් මඩප්පුලි යන අයගේ නිවසද තිබෙන බවත් පහළවත්ත පාර හොඳටම අබලන් වී ඇති බවත් එය අළුත්වැඩියා නොකර මෙම මාර්ගය අළුත්වැඩියා කලේ මන්දැයිද ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී.

පහළවත්ත මාර්ගයද සංවර්ධනය කිරීමට ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම මාර්ගය සංවර්ධනයට රු. ලක්ෂ 10,15 පමණ යන බවත් මෙම මාර්ගය ගිය වසරේ ඉතිරි වූ මුදලින් සිදු කල බවත්, පාර සේදී යන බව පැවසූ බැවින් දෙපසින් කොන්ක්‍රීට් පටි දමා ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ ඉඩමට ගේට්ටුව දැනට reservation එකේ දමා තිබුනද එතුමියට අනෙක් පාරින් ගේට්ටුව දමා ගැනීමට සිදු වන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහි ගැටළුවක් තිබෙන බව දැනගත් පසුව එය නිලධාරීන් යොදවා තමන් අධීක්ෂණය කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය reservation එකටත් කම්බි කණු ගසා ඇති බවත්, මිනිසුන් ඒවාට දොස් පවසන බවත් එම වැට ගලවන ලෙසත් ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ඉල්ලා සිටින ලදී.

තමන් අමල් මහතාගෙන් එම ඉඩම ගත් බවත් එම පිඹුරුපතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ කොටසක් සමඟ ඔවුන්ගේ ගේට්ටුව එහි තිබූ බවත් ඔවුන් වෙන කල දුන් කොටසේ තම ඉඩම තිබෙන බවත්, තමන්ගේ වත්තට ආරක්ෂාවට කණු සිටුවා ඇති බවත් ස්ථිර තාප්පයක් ඉදි කිරීමක් සිදු කර නොමැති බවත්,ඕනෑම වෙලාවක එය ගලවා ඉවත් කල හැකි බවත්,එය නිරීක්ෂණය කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව මහින්ද පැමිණි බවත් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

reservation එකක් නම් කම්බි ගැසීමට කිසිවෙකුට අයිතියක් නොමැති බවත්, සෑම තැනම මෙසේ සිදු වන බවත්,මන්ත්‍රීවරුන්ගේ මැදිහත් වීම නිසා මෙවැනි ගැටළු මතු වන බවත් අද රටේ දේශපාලන ව්‍යාකූලත්වයට ද හේතුව මෙය බවත්,එම වැට ඉවත් කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය තාවකාලිකව ගසා ඇති බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් ආදර්ශය ලබා නොදුනහොත් කටයුතු සිදු කිරීමට නොහැකි බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එක්සත් ජාතික පක්ෂයේ ක්‍රිස්ටි නම් පුද්ගලයෙකු සිටින බවත්, ඔහු විසින් මෙය සිදු කරන බවත්, ඔවුන්ට යාමට අඩි 10 ක පමණ මාර්ගයක්ද ලබා දී ඇති බවත් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

මෙවැනි ගැටළු මින් පෙරද පැමිණි බවත් ඒවා තමන් විසින් ගෙනැවිත් සාකච්ඡා කොට ගැටළුව නිරාකරණය කල බවත් මෙහිද ගැටළුවක් තිබේ නම් සාකච්ඡා කොට විසඳා ගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දුම්රිය දෙපාර්තමේන්තුවේ reservation එකක් තිබෙන බව පවසන බවත්, නමුත් ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ ඉඩමට කවුරුන් හෝ පැමිණ පදිංචි වුවහොත් කුමක් කරන්නේදැයිද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී. දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් ලිඛිතව අවසරය ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමිය පවසන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ලිඛිතව අවසරය ලබ් දී ඇති බවත්, කම්බි ගැසීමක් සිදු කර නොමැති බවත් සතුන් ඉඩමට පැමිණෙන බැවින් කණු සිටවූ බවත් ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එම ලිඛිව අවසරය ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා සහ තමන් එකම කොට්ඨාසයේ බැවින් මේ පිළිබඳව එතුමාද දන්නා බවත්, අත්සන් ලේඛණයේ තිබෙනුයේ ක්‍රිස්ටි මහතාගේ සහ කීපදෙනෙකුගේ අත්සන් බවත්, ඔවුන්ට පාරක් සාදා ගැනීමට සභාවට අත්සන් ලේඛණයක් ඉදිරිපත් කර තිබූ බවත්, නමුත් සැදී තිබෙනුයේ අමල් මඩප්පුලිගේ සහ ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ නිවසට යන මාර්ගය බවත් ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී. තමන්ගේද හිතවතෙකු බැවින් මේ සම්බන්ධයෙන් අමල් මඩප්පුලි මහතා සමඟ කතා කල විට ඔහුද මෙයට අකමැති බව පැවසූ බවත් පහළවත්තට යන මිනිසුන් ඔහුගෙන් ප්‍රශ්න කරන බැවින් එය ඔහුට ලැජ්ජාවක් බව පැවසූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ලිඛිතව සඳහන් දුම්රිය දෙපාර්තමේන්තුවේ අවසරය ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමිය හෝ ගරු මන්ත්‍රීතුමා අනුමත කල බැවින් කර්මාන්ත කමිටුවේ අනුමත කර ඇති බවත්, විරෝධතාවයක් තිබේනම් ලිඛිතව එය ඉදිරිපත් කරන ලෙසත් එවිට ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීමට හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මහා සභාවට එම යෝජනා ඉදිරිපත් වූ බවත්, වාර්තා ගෙන බලන ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව විමර්ශනය කරන ලෙස ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

(lv). ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තම බිරිඳගේ මවගේ අභාවය සම්බන්ධයෙන් ශෝක යෝජනාවක් ඉදිරිපත් කල බවත් එම කටයුත්තේදී ගරු සභාපතිතුමා එමෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලා අවමංගල්‍යය උත්සවය සහභාගී වෙමින් ශෝකය ප්‍රකාශ කිරීම පිළිබඳව දේශපාලන අධිකාරියට මෙන්ම පෞද්ගලිකව දුන් සහයෝගයට පවුලේ සියළු දෙනා වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය පුද කරන ලදී.

සභාවේ හිටපු ගරු මන්ත්‍රී ලලිත් ඔස්කා මහතාගේ හා වර්ථමාන මන්ත්‍රීවරියක් වන ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මියගේ ආදරණීය පියාණන්ගේ මව පසුගිය දින වයස අවුරුදු 102ක් ආයු වළඳා අභාවප්‍රාප්ත වූ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන සටහන් වල අවුරුදු 102ක් ආයු වැළඳු එකම පුරවැසියාද වූයේ එතුමිය බවත්,ලුවිස් පෝල් මහතාගේ ආදරණීය මැණියන් වූ එතුමිය සියවස් සැපිරූ පුරවැසියෙකු ලෙස සඳහන් වී තිබූ බවත් හිටපු ගරු මන්ත්‍රී ලලිත් ඔස්කා මහතාද, ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මියද, එමෙන්ම එතුමන්ලාගේ ආදරණීය මැණියන්ද සභාවට යාවජීව පවුලක සාමාජිකයින් බවත් ප්‍රකාශ කරන ලදී. ආදරණීය මවක් ලෙස කලාවූ උදාර සේවයටද, අවුරුදු 102ක් ජීවත් වන්නට එතුමිය ලැබූ පරමායුෂ තුළ එතුමිය ලැබූ භාග්‍යය සිහිපත් කරන බවත්,මෙම ගෞරවණීය ශෝක ප්‍රකාශයද එම පවුලේ ආදරණීය සාමාජිකයින් වෙත ලිඛිතව දන්වා යවන ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කරන ලදී.

තීරණ අංක 11

හිටපු ගරු මන්ත්‍රී ලලිත් ඔස්කා මහතාද, ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මියගේද පියාණන්ගේ ආදරණීය මවගේ අභාවය වෙනුවෙන් එතුමියගේ ඥාතීන් වෙත ශෝක පණිවිඩයක් යැවීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(V). 2022 වර්ෂය සඳහා අයවැයෙහි සිංගක්කුලිය කොට්ඨාසය සඳහා ඉදිරිපත් කර ඇති යෝජනා සංශෝධනය සලකා බැලීම.

තීරණ අංක 12

2022 වර්ෂය සඳහා වූ අයවැයෙහි සිංගක්කුලිය කොට්ඨාසයට වෙන් කර ඇති යෝජනා වෙනුවට ඇටඹගහවත්ත ප්‍රජා ශාලාව ඉදි කිරීම සුදුසු බවට කොට්ඨාස භාර ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.